

# රතු පැංචා

ඩබ්.ඩබ්.ඩී.දෙවන්ෂා

# රතු පැංචා

© කතෘ ප්‍රකාශනයකි

පළමු මුද්‍රණය 2023 නොවැම්බර් 15

ISBN 978-624-206-898-5

කතාව සහ චිත්‍ර

**ඩබ්.ඩබ්.ඩී.දෙවන්ෂා**

2 E, මහමායා බාලිකා විද්‍යාලය

කතෘගේ වෙනත් කෘති

නපුරු නංගි

සුදුවා සහ කළුවා

## පිදුම..

මට අකුරු කියවූ මගේ ආදරණීය තාත්තාටත්,නිතරම මා ලගින්ම සිටින ආදරණීය අම්මාට සහ මාගේ අක්කාට ත්"මට අකුරු උගන්වා හොද නරක කියා දී ,මෙවැනි නිර්මාණ කිරීමට මාව යොමුකල මාගේ ගුරුවරිය වන චාමිනී පල්ලියගුරු ගුරුතුමියටත් මාගේ පළමු පොත උපහාරයක්ම වේවා…

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්තකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක්වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතිකඅවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20



එකෝමත් එක කාලෙක රතු
පැංචා  කියලා හරිම ලස්සන ලේඩි
බර්ඩ් කෙනෙක් හිටියා.

එයා රතුපාට නිසා යාළුවෝ එයාට
කිවුවේ රතු පැංචා කියලයි.



හැබැයි එයා කවුරුවත් කියන දේ අහන්නෙ නැති හරිම හිතුවක්කාරයෙක්.


ඉතිං මෙයා යාළුවෝ හැමෝම එක්ක සෙල්ලම් කරමින් සතුටින් තමයි ජීවත් වුණේ .



මෙයාලා ගෙවල් හදාගෙන
තිබුණේ ගස්වල කොළ යටයි.
ඉතින් එක දවසක් දා එයා කෑම
සොයාගෙන යද්දි දැක්කා ගහක
අත්තක හදලා තිබුණු ලස්සන
කුරුළු කූඩුවක්.

"අනේ හරිම  ලස්සන කුරුළු කූඩුවක්, මමත් මේවගේ කූඩුවක් හදාගන්න ඕන එතකොට මට පුළුවන්  තනියම ජීවත් වෙන්න."
එයා හිතුවා .





ඉතිං ඔන්න  ඔහොම හිතපු මෙයා එයාගේ යහළුවන්ටත් ඒ බව කීවා.  නමුත් යහළුවෝ කිව්වෙ අපි වගේ පුංචි සතුන්ට එය නොගැළපෙන බවයි. නමුත් එය පිළිගැනීමට රතු පැංචා කැමති වුණේ නෑ .

ඊටපස්සේ එයා කලේ වේලුණු
කොළ එකතු කරලා කූඩුවක්
හදන එකයි .



රතු පැංචා කාගෙවත් උදව් නැතුව
දහඩියත් දමාගෙන කූඩුව හදන්න
පටන් ගත්තා.



මේ හැමදේම දිහා අහස උඩ ඉඳගෙන ඉර මාමා බලාගෙන හිටියා . අනේ ඉතිං මේ වැඩේ දැකලා එයාට හොඳටම හිනා.



ඔන්න ඉතින් දවසක් දා අහස කළුකර මහ වැස්සක් වහින්න පටන් ගත්තා.

රතු පැංචා  ඉක්මණින්ම කූඩුව ඇතුළට රිංගා ගත්තා.

ලොකු වතුර බිංදු අහසින් කඩාගෙන වැටුණා.

රතු පැංචා  හිටපු කූඩුව මේ වතුර බිංදු වලින් පිරුණා.




බයවුණු රතු පැංචා  මහ හයියෙන් කෑ ගහන්න පටන් ගත්තා .

රතු පැංචාගේ කෑ ගැසිල්ල ඇසුණු යහළුවෝ එතනට දුවගෙන ආවා .

රතු පැංචාව ඉක්මණින්ම බේර ගත්තා .



රතු පැංචා සීතල වැඩි වෙලා
වෙව්ලමින් හඬන්න පටන් ගත්තා.
යහළුවෝ  රතු පැංචාව සැනසුවා.
රතු පැංචාට පුංචි ලැජ්ජාවකුත්
ඇතිවුණා .



මේ කරුණු හොඳින් තේරුම්
ගත්ත රතු පැංචා යහළුවන්ට
පොරොන්දුවක් වුණා.
මොකක්ද දන්නවද?

මම කවදාවත් මට නොගැළපෙන දේවල් ආයෙත් නම් කරන්නේ නෑ කියලා........

ඉතිං ඊට පස්සේ එයා හරි සතුටින් ජීවත් වුණා.



නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20